**කුරුවිට ප්‍රාදේශීය සභාව**

**රත්නපුර දිස්ත්‍රික්කය**

**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**---------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 20 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 26 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 11 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කුරුවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**------------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන ආදායම් ලෙස ලැබී තිබුණු රු. 152,329,883 ක් හා ප්‍රාග්ධන වියදම් ලෙස ගෙවීම් කර තිබුණු රු. 146,073,619 ක් තැන්පත් ගිණුම් මඟින් ගැලපීම් කර තිබීම හේතුවෙන් අතිරික්තය රු. 6,256,264 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාලය හා උප කාර්යාල වලට අදාල වූ පිළිවෙලින් රු. 299,701 ක් හා රු. 1,424 ක් වූ කලින් ලද වරිපනම්, සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ආදායම රු. 301,125 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ප්‍රධාන කාර්යාලයේ ස්ථිර කඩකාමර කුලී ලේඛනය අනුව, 2016 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ලැබීම් රු. 8,000 ක් කලින් ලද ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් විෂයයන් 08 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 36,548,385 ක වෙනසක් පැවතුණි.

(ආ) කිරිඇල්ල උප කාර්යාලයීය නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ඖෂධ තොග වාර්තාවට අනුව 2016 දෙසැම්බර් 31 දිනට තොගය රු. 125,520 ක් වුවද, ඖෂධ තොග ගිණුම අනුව එය රු. 83,975 ක් වූයෙන් රු. 41,545 ක වෙනසක් පැවතුණි.

(ඇ) ගිණුම් විෂයයන් 02 කට අදාලව මූල්‍ය ප්‍රකාශන වල සඳහන් අගයන් සහ ඊට අදාල සටහන් වල දැක්වෙන අගයන් අතර රු. 8,284,380 ක වෙනසක් පැවතුණි.

### 1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට නිලධාරීන් 20 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබුණු සේවක ණය එකතුව රු. 41,487 ක් විය.

(ආ) ණයහිමි ලේඛනය අනුව 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල එකතුව රු. 7,513,422 ක් වූ ණයහිමි ශේෂයක් පැවතුණි.

(ඇ) ඉකුත් වර්ෂයන්හීදී සභාව විසින් පාලනය කරන ලද ගිමන්හලකට අදාල වූ, සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති රු. 9,300 ක වැඩිපුර ලැබූ ආදායම් අදාල පරිදි නිරවුල් කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

-------------------------------------------------------

එකතු වටිනාකම රු. 158,311,538 ක් වූ ගිණුම් ශේෂ 07 ක අගය දැක්වෙන විස්තරාත්මක උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

### 1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

---------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| 154(1) වගන්තිය | ඉඩම් විකිණීමෙන් ලැබෙන මුදලින් සියයට 01 ක ප්‍රමාණයක් සභා ආදායමට බැර කලයුතු වුවත්, ඉඩම් වෙන්දේසි 03 කට අදාලව නියමිත ප්‍රමාණයට වඩා අඩුවෙන් අයකිරීම හේතුවෙන් සභා අරමුදලට රු. 764,444 ක් අහිමි වී තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 371(2)(ඇ) | 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලපරාසය තුල අවස්ථා 13 කදී ලබාදී තිබූ එකතුව රු. 2,923,575 ක් වූ අත්තිකාරම් 2016 දෙසැම්බර් වනවිටත් පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | 2001 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල තැන්පත් කරන ලද එකතුව රු. 13,936,769 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (iii) මුදල් රෙගුලාසි 1645 | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව සතු වාහන 07 කට අදාල දෛනික ධාවන සටහන් අඛණ්ඩව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 1996 අගෝස්තු 06 දිනැති අංක 935/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත 1986 මාර්තු 10 දිනැති අංක 392/9 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත 1986 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි නියෝග වල 22 වන නියෝගය | සභා බල ප්‍රදේශය තුල සිදුකර තිබුණු ඉඩම් වෙන්දේසි 04 කට අදාලව පොදු කටයුතු සඳහා පර්චස් 252 ක් අඩුවෙන් වෙන්කර තිබුණි. |

**1.3.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

-------------------------------------------------------------

සභාව විසින් ක්‍රියාත්මක කරන ලද අන්තර් ගම්මාන ගමනාගමන නියමු ව්‍යාපෘතිය යටතේ සභා නිලධාරීන් සහ ගමනාගමන කාර්යාල නිලධාරීන් 09 දෙනෙක් වෙනුවෙන් එකතුව රු. 1,187,500 ක් දීමනා වශයෙන් ගෙවා තිබුණද, ඒ සඳහා ලබාගෙන තිබුණු අනුමැතිය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 23,301,090 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායමට වඩා වැඩිවූ වියදම රු. 88,158,178 ක් වූ බැවින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු. 111,459,268 ක වර්ධනයක් දක්නට ලැබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

මූල්‍ය ප්‍රතිඵලය රු. 111,459,268 කින් වැඩිවීම කෙරෙහි ආදායම් විෂයයන් 04 ක රු. 16,865,834 ක වර්ධනය හා වියදම් විෂයයන් 04 ක රු. 97,856,967 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

-----------------------

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000’ | රු. 000’ | රු. 000’ |
| වරිපනම් හා බදු | 2,420 | 1,830 | 4,556 |
| බදු කුලී | 6,413 | 3,182 | 1,909 |
| බලපත්‍ර ගාස්තු | 1,451 | 2,179 | - |
| වෙනත් ආදායම් | 51,830 | 66,261 | 28,157 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී බලපත්‍ර ගාස්තු, සේවා සඳහා ගාස්තු සහ වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගෙන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 50, සියයට 37 හා සියයට 105 කින් වැඩි වී තිබූ අතර වරිපනම් හා බදු, වරෙන්තු හා දඩ සහ රජයේ දායකත්වය යන ආදායම් විෂයයන්ගේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 34, සියයට 55 හා සියයට 24 කින් අඩුවී තිබුණි.

### 2.3.3 වරිපනම්

----------

2016 ජූලි 30 දින වනවිට වරිපනම් ඒකක 1,187 කින් රු. 4,075,551 ක හිඟ වරිපනම් ශේෂයක් පැවති අතර, ඒ තුල වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවත එන ඒකක 750 කින් ලැබියයුතු රු. 3,233,745 ක් පැවතුණි.

### 2.3.4 බදුකුලී

--------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 ජූලි 30 දින වනවිට රු. 241,684 ක හිඟ අක්කර බදු ශේෂයක් අයවීමට තිබූ අතර, 2016 දෙසැම්බර් 31 දින වනවිටත් එම ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) 2009 වර්ෂයේදී බදු පදනම මත ලබාදී තිබූ නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 05 කින් ආරම්භයේ සිටම බදු ගෙවීම පැහැරහැරීම හේතුවෙන් 2014 ජූලි 30 දින එම කඩ කාමර මුද්‍රා තබා සභාව වෙත පවරා ගෙන තිබුණි. බදු කරුවන් සමඟ ගිවිසුම්ගත වී නොමැති හෙයින් සභාවට ලැබිය යුතු එකතුව රු. 4,436,000 ක් වූ හිඟ කඩ කාමර කුලී සහ දඩ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවක් නොමැති බව දක්වමින් හිඟ කඩ කුලිය කපා හැරීම සඳහා විෂයයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යොමුකර තිබුණි.

### 2.3.5 බලපත්‍ර ගාස්තු

--------------

සභා බල ප්‍රදේශය තුල පිහිටි කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු අයකල යුතු ව්යාපාර ස්ථාන හඳුනාගැනීම උදෙසා වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

### 2.3.6 වෙනත් ආදායම්

------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශය තුල පවත්නා ත්‍රීරෝද රථ නැවතුම්පලවල් වලින් ගාස්තු අයකර ගතහැකිව තිබුණද, සභාව විසින් එම ආදායම් මාර්ගය පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

(ආ) කිරිඇල්ල උප කාර්යාලය මඟින් නඩත්තු කරන ලද ජල ව්‍යාපෘති 02 ක ජල පාරිභෝගිකයින්ගෙන් 2010 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා අයවිය යුතු එකතුව රු. 153,290 ක හිඟ ජල බදු ශේෂය අයකර ගැනීමට අපොහොසත් වී තිබූ අතර, 2016

ඔක්තෝබර් 26 දිනැති මෙහෙයුම් කමිටුවේ අංක 1454 දරන තීරණය මගින් එම හිඟ මුදල් කපාහැරීමට තීරණය කර තිබුණි. කාලානුරූපීව ගාස්තු අයකර ගැනීමට අපොහොසත්වීම මත සභාවට ලැබියයුතු ආදායම් කපාහැරීම සම්බන්ධයෙන් විගණනයට සෑහීමට පත්විය නොහැකි විය.

### 2.3.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂයේ සිට 2016 සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 03 කින් ලැබිය යුතු මුද්දර ගාස්තු හඳුනාගෙන අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 01 කින් 2014 වර්ෂයේ සිට සභාව වෙත අයවිය යුතු එකතුව රු. 1,528,417 ක් වූ හිඟ මුද්දර ගාස්තු අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සුසාන භූමි ලේඛනය අනුව සභාවට අයත් සුසාන භූමි 42 ක් පැවතියද, ඉන් සුසාන භූමි 41 ක් සභාව වෙත පවරා ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) ගිණුම්කරණ හා වරිපනම් මෘදුකාංගය මිලදී ගැනීම සඳහා රු. 100,000 ක් වැයකර තිබුණද, එම මෘදුකාංගය මගින් වූ අපේක්ෂිත ප්‍රතිඵල ලබා කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) 2016 සැප්තැම්බර් 07 දින වනවිට ධාවන තත්ත්වයේ නොපැවති වාහන 03 ක් සම්බන්ධයෙන් අළුත්වැඩියා කිරීමට හෝ විධිමත් පරිදි අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ගමනැගුම අරමුදලින් සභාව සඳහා එකතුව රු. 1,934,479 ක් වූ ස්ථාවර වත්කම් මිලදී ගෙන තිබූ අතර, එහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ නොසලකා අඩුම මිල පමණක් පදනම් කරගෙන තිබුණි. තවද, රු. 573,032 ක් වූ වත්කම් ඉන්වෙන්ට්‍රිගත කර නොතිබුණි.

(ආ) කුරුවිට ද පිනැන්ස් නව ජනපද ජල ව්‍යාපෘතියට අදාලව ළිඳ සකස් කිරීම සඳහා 2014 වර්ෂයේදී අවස්ථා 02 කදී සභා අරමුදලින් එකතුව රු. 1,582,216 ක් වැයකර තිබූ අතර, 2016 සැප්තැම්බර් 15 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී, ළිඳේ පැවති අධික මලකඩ සහිත බව, ළිං ඉවුරේ මෙන්ම ළිඳට යොදා ඇති කොන්ක්‍රීට් බැමි ආශ්‍රිතව ද දැඩිව මලකඩ බැඳී තිබීම, ළිං ඉවුරේ කොන්ක්‍රීට් ස්ථරයෙහි ඇති යකඩ කම්බි කොන්ක්‍රීට් තට්ටුවෙන් පිටතට නිරාවරණය වී මලබැඳීමට ලක්ව තිබීම හා ළිඳ තුලට වැව දෙපසින් ජලය ගලා එමින් පැවතීම නිසා ළිඳෙහි ජලය බීමට නුසුදුසු තත්ත්වයක් පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) 2015 දෙසැම්බර් 17 දිනැති කුරුවිට කුඩා නගර ජල සම්පාදන යෝජනා ක්‍රමයේ කමිටු රැස්වීම් වාර්තාවට අනුව ජල ව්‍යාපෘති කාර්යාලය මඟින් මිල ගණන් කැඳවා ජල මෝටරයක් මිලදී ගැනීමට තීරණය කර තිබුණද, ඒ සඳහා අවශ්‍ය පිරිවිතර හඳුනාගැනීමකින් හා මිල ගණන් කැඳවීමකින් තොරව විධායක කමිටු සාමාජිකයා විසින් ලබාදුන් මිල ගණන් කිහිපයක් අතරින් අඩුම මිල පදනම් කරගෙන මුදල් චෙක්පතක් මත වටිනාකම රු. 1,356,000 ක් වූ ජල මෝටරයක් මිලදී ගෙන තිබුණි. එම මෝටරය අවශ්‍යතාවයට නොගැලපෙන හා විදුලි පරිපථ වලට ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දින වනවිට අක්‍රීය තත්ත්වයේ පැවතුණු බැවින් වැයකර ඇති මුදල නිෂ්කාර්යය වියදමක් බවට පත්වී තිබුණි.

(ඈ) ඉහත “(ඇ)” ඡේදයේ සඳහන් ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ 2015 මාර්තු 03 දින රු. 127,045 ක් වූ ජල උපාංග මිලදී ගෙන තිබූ අතර, ඒ තුල ඇතුලත් ජලනල 97 කින් 92 ක්ම 2016 සැප්තැම්බර් 08 දින වනවිටත් නිෂ්කාර්යයව පන්සල් භූමියක පිහිටි ජල ව්‍යාපෘතියට අයත් ගබඩාවක් තුල පැවතුණි.

(ඉ) සභාව විසින් ක්‍රියාත්මක කරන ලද කුඩා නගර ජල ව්‍යාපෘතියේ ධාරිතාව වැඩිදියුණු කිරීමේ අරමුණින් රු. 827,561 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවා තිබූ නමුත් මණ්ඩලය විසින් ඉල්ලා තිබුණු පහසුකම් ලබා නොදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වනවිටද

එම කර්මාන්තයෙන් කිසිදු ප්‍රතිලාභයක් කුඩා නගර ජල සම්පාදන ක්‍රමයට සිදුවී නොතිබූ අතර, ඒ හේතුවෙන් වැයකරන ලද රු. 827,561 ක මුදල නිෂ්කාර්යය වියදමක් වී තිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

(අ) කුරුවිට පොදු ක්‍රීඩාපිටියට සමූපකාර ගොඩනැගිල්ල ඉදිරිපිටින් පිවිසුම් මාර්ගය තැනීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) වැඩ වටිනාකම රු. 969,086 ක් වූ උක්ත කර්මාන්තයේ වැඩ විෂයයන් 02 ක සත්‍ය මිනුම් ප්‍රමාණය ඉක්මවා එකතුව රු. 9,854 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ii) ක්‍රීඩාපිටිය අසල කාණුව ඉදිකිරීම සඳහා රු. 139,579 ක් ගෙවීම් කර තිබුණද, ඉදිකිරීමෙන් පසුව ක්‍රීඩාපිටිය පුළුල් කිරීම සඳහා කාණුව කඩා ඉවත් කර පළාත් මාර්ග අමාත්‍යාංශය විසින් නැවත ඉදිකිරීම වෙනුවෙන් රු. 565,404 ක් වැයකර තිබුණි. ඒ අනුව, පළාතේ රාජ්‍ය ආයතන අතර මනා සම්බන්ධීකරණයකින් තොරව කටයුතු කිරීම සහා අරමුදල මඟින් දරා තිබූ රු. 139,579 ක් නිෂ්කාර්යය වී තිබුණි.

(iii) කාණුව නැවත සකස් කිරීම හේතුවෙන් ක්‍රීඩාපිටියට පිවිසීම සඳහා ඉදිකරන ලද මාර්ගය ක්‍රීඩා පිටියට වඩා ඉහලින් පිහිටා තිබූ බැවින්, මාර්ගයේ සිට ක්‍රීඩාපිටියට පා ගමනින් හෝ පිවිසීමට හැකියාවක් නොමැති තත්ත්වයට පත්වී තිබුණි.

(ආ) කුරුවිට ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට පිවිසුම් මාර්ගය ගල් එළීම, පිඩලි ඇල්ලීම සහ මල් සිටුවීමේ කර්මාන්තය යටතේ රු. 82,444 ක් වැයකර තිබුණද, එය නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් 2016 දෙසැම්බර් 23 දින වනවිට පිඩලි විනාශ වී තිබුණු අතර, වැය කරන ලද මුදල නිෂ්කාර්යය වියදමක් බවට පත්වී තිබුණි.

(ඇ) 2014 වර්ෂයේදී ඉදිකරන ලද කුරුවිට ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිරිපස දැල් ගැසීම, පිඩලි ඇල්ලීම සහ මල් සිටුවීමේ කර්මාන්තයේ එක් වැඩ විෂයයක සත්‍ය මිනුම් වලට වඩා රු. 46,043 ක් වැඩිපුර ගෙවා තිබූ බව භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 03 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 26 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**--------------------------------**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

**------------------------------**

සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම 2016 අගොස්තු 10 දින අනුමත කර තිබුණි.

**5. පද්ධති හා පාලනය**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | මූල්‍ය ප්‍රකාශන අගයන් හා සටහන් වල අගයන් නොසැසඳීම |
| | | (ii) | ලෙජර් ගිණුම් හා උපයෝගී ලේඛන නොසැසඳීම |
| | | (iii) | ගිණුම් වලින් අත්හැරීම් |
| | | (iv) | තහවුරු සාක්ෂි නොමැති වීම |
| | | (vi) | ණයහිමි ලේඛන තුලනය නොකිරීම |
| (ආ) | ආදායම් පරිපාලනය | (i) | නියමිත ආදායම හඳුනා නොගැනීම |
| | | (ii) | ආදායම් අයකර නොගැනීම |
| (ඇ) | වත්කම් පාලනය | | වත්කම් නිෂ්කාර්යයව පැවතීම සහ භාවිතයට නුසුදුසු වත්කම් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග නොගැනීම |